**බී සී සී ලංකා සමාගම (රාජ්‍ය) – 2016/2017**

**-----------------------------------------------------**

බී සී සී ලංකා සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

---

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.36,219,153 ක් වූ ගෙවිය යුතු එකතුකල අගය මත බදු වටිනාකම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන ලද ශේෂය සමග එකඟ නොවූ අතර ගණනය කිරීම් හා බදු වාර්තා නොමැතිවීම හේතුවෙන් එම වගකීම්වල විශ්වාසවන්තභාවය හා නිවැරදිභාවය තවදුරටත් පරීක්ෂා කල නොහැකිවිය.

**2 මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 මාර්තු 31 දිනට බී සී සී ලංකා සමාගමෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණවලින් පෙනීයන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්, සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---

2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු.75,405,335 ක ගෙවිය යුතු ගිණුම් ශේෂය වර්ෂ 10 කට අධික කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.21,687,424 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.3,206,572 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,480,852 ක වර්ධනයක් ඇති වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දළ ලාභය

රු.5,061,311 කින් හා වෙනත් මෙහෙයුම් ආදායම් රු.15,640,055 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක සමාලෝචනය

| අනුපාතය | 2016/2017 | 2015/2016 |
|---|---|---|
| | සියයට | සියයට |
| දල ලාභ අනුපාතය | 8 | 5 |
| ශුද්ධ ලාභ අනුපාතය | 18 | 8 |

ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාගමේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 10 කින් වැඩිවී තිබුණද දල ලාභ අනුපාතය සියයට 3කින් පමණක් වැඩිවී තිබුණි. සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වයට සෘජුව දායක නොවන අබලි වත්කම් විකිණීම හා කඩ කාමර කුලියට දීම මගින් ලැබූ ආදායම් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට අදාළව ප්‍රධාන නිෂ්පාදනයන්ගේ හා අනෙකුත් ආදායම්වල දායකත්වය පහත පරිදි වේ.

| නිෂ්පාදිත අයිතමය/ආදායම් විෂයය | දායකත්වය 2016/2017 | 2015/2016 |
|---|---|---|
| | රු. | රු. |
| සබන් | 43,847,227 | 35,770,989 |
| පොල්තෙල් | 88,642,648 | 59,945,350 |
| ඩ්‍රම් ෂීට් | 110,185 | 4,930,994 |
| කුලී ආදායම | 59,484,932 | 54,637,606 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සබන් නිෂ්පාදන අංශයේ ආදායම සියයට 23 කින් වර්ධනය වී තිබූ අතර සබන් නිෂ්පාදන සඳහා අඛණ්ඩ ඉල්ලුමක් පැවතුනද දැනට නිෂ්පාදන බෙදා හැරීමේ කටයුතු කොළඹ, නුවර, අනුරාධපුරය හා ගම්පහ දිස්ත්‍රික්කවල ආයතන කිහිපයක පමණක් සීමාවී තිබුණි. තවද, සමාගමේ නිෂ්පාදිතය ප්‍රමාණවත් නොවීම සහ ගැණුම්කරුවන් විසින් මාස 03ක ණය කාල සීමාවක් ඉල්ලා තිබුණද එය ලබාදීමේ අපහසුතාවය හේතුවෙන් වෙළඳපල පුළුල් කිරීම සම්බන්ධයෙන් ගැටළු මතු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී තෙල් පිරිපහදු අංශයේ ආදායම සියයට 48 කින් වර්ධනය වී තිබූ අතර නිෂ්පාදිත පොල්තෙල් වෙළඳපොලේ පවතින අනෙකුත් පොල්තෙල් වර්ග හා සැසඳීමේදී ඉහළම ගුණත්වයෙන් යුක්ත බව රසායනාගාර වාර්තා අනුව ද හෙලිදරව් විය. එහෙත් ප්‍රචාරක වැඩසටහන් හෝ අලෙවි ප්‍රවර්ධන ක්‍රම මගින් අලෙවිය වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් ලංකා හෝටල් සංස්ථාවේ කොටස් මිලදී ගැනීම වෙනුවෙන් රු.10,000,000 ක් ආයෝජනය කර තිබූ නමුත් මෙම වාර්තාවේ දින වනවිටත් ඒ සඳහා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ආ) සමාගම විසින් ප්‍රධාන වශයෙන් සබන් නිෂ්පාදනය, පොල් තෙල් පිරිපහදුව, ඩ්‍රම්ෂීට් විකිණීම හා ගුදම් යන්ත්‍රාගාර කටයුතු සිදුකර තිබූ අතර 2016 වර්ෂයේ සිට ඩ්‍රම්ෂීට් විකිණීම සහ ගුදම් යන්ත්‍රාගාර කටයුතු නවතා දමා තිබූ නමුත් පසු ගිය වර්ෂ 03ක කාලපරිච්ඡේදය තුලදී තෙල් පිරිපහදු අංශයේ ආදායම සීඝ්‍ර ලෙස වර්ධනය වී තිබුණි. එසේ වුවද, සමාගමට අයත් අක්කර 12, රූඩ් 03, පර්චස් 8.77ක් සහිත පිරිවැය රු.8,193,775,600 ක භූමි භාගය අමාත්‍ය මණ්ඩල අනුමැතීන් මගින් රජයට පවරා ගෙන තිබූ අතර ඒ හේතුවෙන් සමාගමේ පැවැත්ම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයකට මුහුණ පෑමට සිදුවී තිබුණි. උද්ගතවී තිබුණු ගැටළුකාරී තත්ත්වය නිරාකරණය කර ගැනීම සඳහා හා සමාගම පවත්වාගෙන යාමට සුදුසු ඉඩමක් ලබාදීම සඳහා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් විශේෂඥ කමිටුවක් පත්කර, තිබූ අතර කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ අනුව සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය වත්කම්**

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී රු.2,234,226 ක් ගෙවා අළුත්වැඩියා කර තිබුණු සබන් නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගන්නා soap noodle plant යන්ත්‍රයක් 2018 වර්ෂය දක්වාම නිෂ්පාදන කටයුතු සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුනි .

(ආ) 2016 වර්ෂයේ සිට ඩ්‍රම්ෂීට් නිෂ්පාදනය නතර කර තිබීම හේතුවෙන් එම යන්ත්‍රාගාරයට අයත් රු.1,123,434 ක්වූ යන්ත්‍රසූත්‍ර සහ රු.2,651,181 ක් වටිනා ඩ්‍රම්ෂීට් තොගද එම වර්ෂයේ සිටම නිෂ්ක්‍රීයව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2015 ජනවාරි 27 දිනැති අංක පීඊඩී/27 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සෑම රාජ්‍ය සමාගමක්ම මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2017 ජූලි 11 දින ඉදිරිපත් කර තිබූ අතර, සංශෝධිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 ජනවාරි 30 දිනදීය.

### 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2014/2015 හා 2015/2016 වර්ෂවල වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.3 විගණන හා කළමනාකරණ කමිටු

------------------------------------

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සෑම මාස තුනකට වරක් විගණන හා කළමනාකරණ කමිටුවක් පැවැත්විය යුතු නමුත් 2016/2017 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. සමාගමේ ඉඩම් හැර සම්පූර්ණයෙන් ක්ෂය කරනු ලැබූ එහෙත් භාවිතා කරනු ලබන අනෙකුත් වත්කම් සියල්ල ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත නොකිරීම හේතුවෙන් වත්කම්වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් නොවීම හේතුවෙන් ගිණුම්කරණය පිළිබඳ විශේෂ අවධානය යොමුවිය යුතුය.